**අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව - 2021**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ගෙවන ලද වැටුප හා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරන ලද සේවක වැටුප් වියදම පිළිවෙලින් රු. 29,471,188 ක් හා රු. 27,104,826 ක් වූයෙන් ලැබිය යුතු රු. 2,366,362 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ලැබිය යුතු වැටුප් ප්‍රතිපූරණ මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | 2012 වර්ෂයත් 2019 වර්ෂයත් අතර ලද එකතුව රු. 707,066 ක් වූ විවිධ ආදායම්, ආදායම් ලෙස හඳුනානොගෙන තැන්පතු ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල එම වටිනාකමින්ම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | රු.106,000 ක් 2022 වර්ෂයේදී නියාදනය කළ බවත්, ඉතිරි ශේෂය නිවැරදිව හඳුනාගෙන ආදායමට ගනිමි. | කල් ඉකුත් වූ තැන්පත් නියාදනය කල යුතුය. |
| (ඇ) | රු. 264,228 ක් වූ ණය වාරික ආපසු ගෙවීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ නොදක්වා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු. 537,788 ක් ලෙස දැක්වූයෙන් රු. 273,560 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | ණය වාරික ආපසු ගෙවීම ඉදිරි වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් නිවැරදි කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙලකළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු. 163,950 ක් වූ තොග අයිතම 33 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | අතපසුවීමකින් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කළ බවත්, ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරමි. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු. 165,417 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් විමසීමක් කර ලැබෙන පිළිතුර අනුව ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කරමි. | ලැබිය යුතු ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත අයකර ගත නොහැකි රු. 160,944 ක් වූ වීථි පහන් නඩත්තු වියදම ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ගිණුම්ගත කරමි. | ලැබිය යුතු ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය . |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේදී රු. 73,300 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ප්‍රාග්ධන වියදම අඩුවෙන් දැක්වුණි. | රු. 73,300 ක් අතපසු වීමකින් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කළෙමි. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කල යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී රු. 74,925 ක් වූ පෙර වර්ෂයන්ට අදාළ වියදම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අතපසු වීමකින් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කළෙමි. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් එකතුව රු. 23,210,305 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන / උපලේඛන වල දැක්වෙන ශේෂ අතර රු.3,885,649 ක අසමානතා පැවතුනි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,979,500 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 531,501 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 08 කට අදාළව නිවැරදි මිල ගණන් යොදා නොගෙන ඇස්තමේන්තු සකස් කිරීම, නිවැරදිව මිනුම් ලබා නොගැනීම සහ රජයට වාසිදායක මිල ගණන් යොදා නොගැනීම යන කරුණු වලට අදාළව එකතුව රු. 1,467,273 ක් වැඩිපුර ගෙවීම් කිරීම සඳහා ගෙවීම් වාර්තා සකස් කර තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීමේදී එම කර්මාන්ත පිහිටි භූමියේ ස්වභාවය, අවශ්‍ය සම්පත් සපයා ගැනීමෙ හැකියාව සලකා බලා වඩාත්ම සුදුසු හා ගැලපෙන මිනුම් භාවිතා කළ බවත්, බිල්පත් පියවීමේදී සම්පූර්ණ කර ඇති වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කරමි. | වැඩිපුර බිල්කර ඇති මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුය. |